# ICBS 55

## බෞද්ධ අධිකරණ ක්‍රමවේදය තුළ පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ආචාර්ය කුමාරි මදනායක
*කථිකාචාර්ය, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, බොල්ලෑගල, කැළණිය*
*kumarimadanayaka@gmail.com*

*"මනුෂ්‍යයන් වීමේ හේතුව නිසා ම නිසඟයෙන් ම හිමි වන්නා වූ කිසි ම නීතියකින් කඩ කළ නො හැකි වූ සුවිශේෂ නීතිය මානව අයිතිවාසිකම් වේ."* මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ලා යුක්තිය පසිඳලීම අත්‍යවශ්‍ය ක්‍රියාවලියකි. එහි ලා ව්‍යවස්ථාදායකය තුළින් නීති පැනවීමත්, විධායකය තුළින් එම නීති ක්‍රියාත්මක කිරීමත්, අධිකරණය තුළින් යුක්තිය පසිඳලීමත් සිදුකෙරේ. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී ලොව අන් සෑම අධිකරණ ක්‍රියාවලියකට ම වඩා සුවිශේෂ මෙන් ම මානව අයිතිවාසිකම් ආරක්ෂා වන අධිකරණ ක්‍රියාවලියක් බුදුරජාණන් වහන්සේ විසින් හඳුන්වා දී ඇත. බෞද්ධ අධිකරණ ක්‍රමවේදය තුළ පරිපූරක සංඝසභාවක්, එම ආවාසයේ ම කොමිසමක් පත් කිරීමෙන්, වෙනත් ආරාමයක භික්ෂූන් විසින්, සහ සංඝසභාවේ බහුතර ඡන්දයෙන් යන සංඝාධිකරණ ක්‍රම සතරක් ක්‍රියාත්මක වේ. මෙම බෞද්ධ අධිකරණය ජනසම්මතවාදී ක්‍රමයට අනුකූල ව සිදු වන අතර, නඩු විභාග කිරීම සිදුවන්නේ ව්‍යක්ත ප්‍රතිබලසම්පන්න භික්ෂූන්ගෙන් සමන්විත විනිශ්චය සභාවක දී ය. එහි දී සාධාරණයක් ඉටු නො වන්නේ නම් පිළිවෙලින් සමානච්ඡන්දයෙන් ද, බහුතර ඡන්දයෙන් ද යුක්තිය පසිඳලීම සිදුකෙරේ. නඩු විභාගයේ දී *විවිදාධිකරණය, අනුවාදාධිකරණය, ආපත්තාධිකරණය* හා *කිච්චාධිකරණය* වශයෙන් අධිකරණ සතරක් ක්‍රියාත්මක වන අතර ඕනෑම අධිකරණයක් විසඳීමේ දී *සංඝ, ධම්ම, විනය, පුග්ගල සම්මුඛතා* (සංඝයාගේ එක් රැස්වීම, විනිශ්චය සත්‍යය කරුණක් සඳහා වීම, විනිශ්චය විනයානුකූල වීම, විනිශ්චය සඳහා චෝදක චුදිත දෙපක්ෂය ම සහභාගි වීම) වශයෙන් අවශ්‍යතා හතරක් සම්පූර්ණ විය යුතුය. *සම්මුඛාවිනය, සතිවිනය, අමුළ්හකවිනය, පටිඤ්ඤාතකරණවිනය, යෙභුය්‍යසිකාවිනය, තස්ස පාපිය්‍යසිකාවිනය, තිණවත්ථාරකවිනය* වශයෙන් සමථ ක්‍රම කිහිපයක් භාවිත කෙරෙන අතර එම එක් එක් ක්‍රමය භාවිත කෙරෙන්නේ අධිකරණයේ ස්වභාවය අනුව හා චූදිතයාගේ ස්වභාවය අනුවය. තව ද මෙහි දැකිය හැකි සුවිශේෂත්වය වන්නේ විනිශ්චය සඳහා තෝරා පත් කරගන්නා *සලාකගහාපක* නම් භික්ෂුව සතර අගතියෙන් තොර අයෙකු වීමයි. ඒ අනුව නූතන අධිකරණය තීන්දුවලට හා තත් ක්‍රියාවලියට සාපේක්ෂ ව බෞද්ධ අධිකරණය තුළින් පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා වන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වන අතර බෞද්ධ අධිකරණ ක්‍රමවේදය තුළ පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරය පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරමින් රැස් කරගන්නා ලද ගුණාත්මක දත්ත තුලනාත්මක අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කිරීම මෙහි දී භාවිත පර්යේෂණ ක්‍රමවේදයයි.

**මුඛ්‍ය පදඃ** අධිකරණය, අයිතිවාසිකම්, බෞද්ධ, යුක්තිය, සාධාරණය